# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 31 දරන සමුපකාර තොග වෙළෙඳ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1978 ජූලි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 31 දරන සමුපකාර තොග වෙළෙඳ සංස්ථා (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1978 ජූලි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 31/78.

**සමුපකාර තොග වෙළෙඳ සංස්ථා පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 31 දරන සමුපකාර තොග වෙළෙඳ සංස්ථා (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. කෙටි නාමය.

**2.** 1957 අංක 39 දරන පනතින් සංශෝධිත සමුපකාර තොග වෙළෙඳ සංස්ථා පනතෙහි 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් එ වගන්තිය තවදුරටත් මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 126 වන අධිකාරයේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(1) අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන නව දෙනකුට නොවැඩි වූ ද පස් දෙනකුට නොඅඩු වූ ද සාමාජිකයන්ගෙන් මණ්ඩලය සමන්විත විය යුතු අතර ඔවුන් අතුරින්—

(අ) එක් තැනැත්තකු මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු ය; තව ද

(ආ) එක් තැනැත්තකු සමුපකාර විෂයය භාර අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු ය.".

ජ 34705 — 11,535 (78/06)